# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.01.24 පැය 1225 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 135 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2025.01.23 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | කෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 60 | 280 | තඹ දඟර 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2025.01.23 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මදුරාගොඩ පොලිස් වසමේ සිදුකරන ලද වැටලීමකදී ඇන්ටන් වත්ත ප්‍රදේශයේ සඟවා තිබූ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා එම ජීව උණ්ඩ 03 ක් පොලිස් භාරයට ගෙන මදුරාගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 68 ක් වන උඩහොරම්බුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මදුරාගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුර.**

2025.01.23 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිලාවතුර පොලිස් වසමේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 ක් මත්ද්‍රව්‍ය අලෙවියෙන් උපයාගත් බවට

සැක කරන මුදල් රුපියල් 36,000/= ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සිලාවතුර පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන මරදමඩු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිලාවතුර පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව සුදු සඳුන් ශාක කොටස් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා තංගල්ල කඳවුර.**

2025.01.23 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කායර් බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මිද්දෙනිය පොලිස් වසමේ කාරියමඩිත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව පොත්ත ඉවත් කරන ලද සුදු සඳුන් ශාක කඳන් කොටස් කිලෝ 25 ක් හා පිටත පොත්ත සහිත සුදු සඳුන් ශාක කඳන් කොටස් කිලෝ 93 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වලස්මුල්ල අධිකරණ කායර්ාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන කාරියමඩිත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**